ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2016 ජනවාරි මස 28 වැනි දින** |

## 2015 නොවැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

අපනයන ආදායමෙහි සිදු වූ අඩු වීමට වඩා ඉහළ වේගයකින් ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2015 දෙසැම්බර් මාසයේ දී වෙළඳ හිඟය 2014 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඩු විය. සංචාරක ඉපැයීම් අඛණ්ඩව වර්ධනය වූ නමුත් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි වර්ධනය මන්දගාමී විය. මෑතක දී සිදු කරනු ලැබූ එ.ජ. ඩොලර් මිලියන 1,500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙහි ලැබීම් සමඟ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ශක්තිමත් විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

2015 නොවැම්බර් මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 835 ක් දක්වා සියයට 9.3 කින් පහත වැටුණි. තේ, රබර් නිෂ්පාදිත, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ඇඟලුම් අපනයනවල පහළ යෑම් වාර්තා වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මුදල් අවප්‍රමාණය වීම හා විශේෂයෙන් මැදපෙරදිග රටවල පවතින භූ-දේශපාලනික වාතාවරණය හේතුවෙන් තේවලට පවතින ඉල්ලුම තවදුරටත් පහත වැටුණි. මේ අනුව 2015 නොවැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 21.1 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 4.11 ලෙස පසුගිය මාසයේ දී වාර්තා වූ පරිදිම නොවෙනස්ව පැවතිය ද 2014 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් 4.75 ට සාපේක්ෂව පහළ අගයක පැවතිණි. නොවැම්බර් මාසයේ දී රබර් නිෂ්පාදිත අපනයන

ආදායම තවදුරටත් දුර්වල වූ අතර, එය පෙර වසරේ අනුරූප කාලයට සාපේක්ෂව සියයට 19.5 කින් පහත වැටුණි. මීට අමතරව, නැව් හා ගුවන් යානා ඉන්ධන අපනයන පරිමාවන් සියයට 32.9 කින් ඉහළ ගිය ද මිල ගණන් පහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 40.5 කින් පහළ යෑමක් වාර්තා කළේය. යුරෝපා වෙළඳපොළ වෙත කළ අපනයනයන්ගේ පහළ යෑම පිළිබිඹු කරමින් මුළු අපනයනයෙන් සියයට 46 ක් පමණ වූ ඇඟලුම් අපනයන ආදායම 2015 නොවැම්බර් මාසයේ දී සියයට 2.7 කින් අඩු විය. කෙසේ වුවද, ඇමරිකා එක්සත් ජනපදය හා සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වෙත වූ ඇඟලුම් අපනයන ආදායම 2015 නොවැම්බර් මාසයේ දී පිළිවෙලින් සියයට 9.3 කින් හා 7.5 කින් වර්ධනය විය. තවද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, පොල් නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන ආදායම අඩු වීම ද සමස්ත අපනයනයන් අඩු වීම කෙරෙහි සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, කුළුබඩු අපනයන ආදායම 2015 වසරේ මේ දක්වා අඛණ්ඩ වර්ධනයක් වාර්තා කරන ලදී. මීට අමතරව මැණික් සහ කෑමට ගත හැකි ගෙඩි වර්ග උප කාණ්ඩයන්හි අපනයන ආදායම ද 2015 නොවැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2015 පළමු මාස එකොළහ තුළ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 9,679 ක් දක්වා සියයට 4.4 කින් පහත වැටුණු අතර තේ, රබර් නිෂ්පාදිත හා මුහුදු ආහාර අපනයනයන් සැලකිය යුතු ලෙස පහළ යෑම මෙමගින් පිළිබිඹු විය. 2015 වසරේ පළමු මාස එකොළහ තුළ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළවල් ලෙස ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය, ඉතාලිය හා චීනය පැවති අතර, එම රටවල් වෙත කළ අපනයන මුළු අපනයනවලින් සියයට 54 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2014 නොවැ. (එ.ජ. ඩො. මිලියන) | 2015 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **684.1** | **633.2** | **(7.4)** | **7,509.9** | **7,342.6** | **(2.2)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 420.7 | 410.2 | (2.5) | 4,478.9 | 4,426.8 | (1.2) |
| එයින්, ඇඟලුම් | 398.3 | 387.7 | (2.7) | 4,250.2 | 4,186.3 | (1.5) |
| රබර් නිෂ්පාදිත | 69.6 | 56.0 | (19.5) | 816.9 | 702.7 | (14.0) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 29.1 | 22.2 | (23.8) | 312.0 | 270.4 | (13.3) |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 29.9 | 17.8 | (40.5) | 313.6 | 343.6 | 9.6 |
| සත්ව ආහාර | 4.8 | 4.9 | 1.2 | 58.8 | 69.7 | 18.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.8 | 34.2 | 22.9 | 364.1 | 304.7 | (16.3) |
| එයින්, මැණික් | 9.5 | 20.0 | 110.7 | 163.7 | 147.0 | (10.2) |
| ප්‍රවාහන උපකරණ | 4.4 | 7.0 | 59.3 | 115.2 | 238.2 | 106.8 |
| වෙනත් | 97.9 | 81.0 | (17.3) | 1,050.3 | 986.5 | (6.1) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **233.1** | **199.4** | **(14.5)** | **2,544.5** | **2,290.4** | **(10.0)** |
| තේ | 137.6 | 108.5 | (21.1) | 1,488.6 | 1,235.3 | (17.0) |
| පොල් | 27.6 | 23.3 | (15.5) | 329.8 | 328.0 | (0.6) |
| කුළුබඩු | 23.3 | 30.1 | 29.1 | 236.2 | 353.0 | 49.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 16.1 | 17.9 | 11.1 | 144.1 | 146.0 | 1.3 |
| එයින්, ආහාරයට ගත හැකි ගෙඩි වර්ග | 9.0 | 11.7 | 29.2 | 51.7 | 63.7 | 23.2 |
| මුහුදු ආහාර | 20.1 | 13.4 | (33.3) | 230.9 | 148.0 | (35.9) |
| වෙනත් | 8.5 | 6.2 | (27.4) | 114.9 | 80.0 | (30.4) |
| **3. ඛනිජ වර්ග සහ වෙනත්** | **3.9** | **2.6** | **(33.3)** | **70.6** | **45.6** | **(35.3)** |
| **මුළු අපනයන** | **921.2** | **835.2** | **(9.3)** | **10,125.0** | **9,678.6** | **(4.4)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයන ක්‍රියාකාරිත්වය**

ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහළ යෑමට සමගාමීව 2015 නොවැම්බර් මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,465 ක් දක්වා සියයට 11.0 කින් තවදුරටත් අඩු වූ අතර මෙය 2015 වසරේ වාර්තා වූ අඩුම මාසික ආනයන වියදම විය. පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදමේ වර්ධනයක් තිබියදීත්, අන්තර් භාණ්ඩ ආනයන වියදමේ සැලකිය යුතු පහළ යෑම මෙම අඩු වීමට හේතු විය. බොර තෙල් සහ පිරිපහදු කරන ලද ඛණිජ තෙල් යන දෙවර්ගයෙහිම ආනයන පරිමාවන් වර්ධනය වුවද, ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහළ යෑම, 2015 නොවැම්බර් මාසයේ දී ඉන්ධන ආනයන වියදම සියයට 27.9 කින් පහළ යෑමට හේතු විය. බොර තෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2014 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් 76.82 හා සැසඳීමේ දී 2015 නොවැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් 45.46 ක් දක්වා පහත වැටුණි. මීට අමතරව, 2015 නොවැම්බර් මාසයේ ආනයන වියදමේ සමස්ත අඩු වීම කෙරෙහි සියයට 55 කට වැඩි දායකත්වයක් ලබා දෙමින් රෙදිපිළි හා රෙදිපිළි උපාංග, පොහොර සහ දියමන්ති හා වටිනා ගල් හා ලෝහ ආනයන වියදම් ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 22.3 කින්, සියයට 61.6 කින් සහ සියයට 80.7 කින් අඩු විය. 2015 නොවැම්බර් මාසයේ දී සහල් ආනයන වියදම අඛණ්ඩව හත්වන මාසයටත් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර දේශීය වෙළඳපොළෙහි ප්‍රමාණවත් සහල් තොග පැවතීම සහ පෙර වසරේ ඉහළ සහල් ආනයනයක් වාර්තා වී තිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මගී ප්‍රවාහන නෞකාවක් සහ සැහැල්ලු යාත්‍රා තුනක් ආනයනය කිරීම නිසා 2014 නොවැම්බර් මාසයේ දී ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් මෙම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2015 නොවැම්බර් මාසයේ ප්‍රවාහන උපකරණ ආනයන වියදම සියයට 41.4 කින් අඩු විය. 2015 නොවැම්බර් මාසයේ දී රථවාහන ආනයන වියදම පසුගිය මාසයට සාපේක්ෂව අඩු අගයක් වාර්තා කළ ද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 25.0 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා මෝටර් කාර් ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම මෙම මාසයේ දී වර්ධනය විය.


සමුච්චිත වශයෙන් සැලකීමේ දී, 2015 පළමු මාස එකොළහ තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 17,244 ක් දක්වා සියයට 2.1 කින් අඩු විය. 2015 නොවැම්බර් වන විට ප්‍රධානතම ආනයන ප්‍රභවයන් ලෙස ඉන්දියාව, චීනය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව පැවති අතර මෙම රටවල් මුළු ආනයනයන්ගෙන් සියයට 61 කට පමණ දායක විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2014 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **365.1** | **391.0** | **7.1** | **3,430.4** | **4,329.6** | **26.2** |
| ආහාර හා පාන වර්ග | 147.8 | 127.6 | (13.7) | 1,464.5 | 1,478.3 | 0.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 53.5 | 2.6 | (95.1) | 246.0 | 148.5 | (39.6) |
| කිරි නිෂ්පාදිත | 25.4 | 21.6 | (15.0) | 318.0 | 229.6 | (27.8) |
| මුහුදු ආහාර | 13.2 | 21.2 | 59.9 | 129.6 | 194.0 | 49.6 |
| සීනි සහ රසකැවිලි | 7.6 | 16.7 | 120.7 | 245.2 | 238.0 | (2.9) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 48.1 | 65.5 | 36.2 | 525.5 | 668.2 | 27.2 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 217.3 | 263.4 | 21.2 | 1,965.9 | 2,851.3 | 45.0 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 30.8 | 35.0 | 13.6 | 344.8 | 418.6 | 21.4 |
| රථවාහන | 94.1 | 117.6 | 25.0 | 785.2 | 1,294.0 | 64.8 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 92.4 | 110.8 | 19.8 | 836.0 | 1,138.7 | 36.2 |
| **2. අන්තර් භාණ්ඩ** | **909.5** | **690.6** | **(24.1)** | **10,460.8** | **8,737.3** | **(16.5)** |
| ඉන්ධන | 268.6 | 193.7 | (27.9) | 4,341.4 | 2,438.0 | (43.8) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 215.7 | 167.7 | (22.3) | 2,101.8 | 2,054.9 | (2.2) |
| පොහොර | 54.1 | 20.8 | (61.6) | 248.2 | 261.6 | 5.4 |
| දියමන්ති සහ වටිනා ගල් වර්ග හා ලෝහ | 25.2 | 4.9 | (80.7) | 158.1 | 147.4 | (6.8) |
| කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 47.9 | 34.4 | (28.4) | 440.4 | 431.6 | (2.0) |
| ඛනිජ නිෂ්පාදිත | 12.6 | 11.5 | (8.6) | 190.9 | 221.5 | 16.0 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 51.6 | 52.3 | 1.2 | 549.3 | 562.6 | 2.4 |
| තිරිඟු හා ඉරිඟු | 14.9 | 19.6 | 31.7 | 357.0 | 322.3 | (9.7) |
| වෙනත් | 218.8 | 185.8 | (15.1) | 2,073.8 | 2,297.6 | 10.8 |
| **3. ආයෝජන භාණ්ඩ** | **371.1** | **382.6** | **3.1** | **3,715.1** | **4,162.7** | **12.0** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 180.0 | 195.1 | 8.4 | 1,923.9 | 2,054.2 | 6.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 97.9 | 132.7 | 35.6 | 1,181.5 | 1,223.5 | 3.6 |
| ප්‍රවාහන උපකරණ | 92.2 | 54.1 | (41.4) | 605.9 | 880.0 | 45.2 |
| වෙනත් | 1.0 | 0.7 | (26.6) | 3.8 | 4.9 | 30.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.2** | **0.8** | **(34.0)** | **13.0** | **14.8** | **13.6** |
| **මුළු ආනයන** | **1,646.8** | **1,464.9** | **(11.0)** | **17,619.3** | **17,244.4** | **(2.1)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය**




**වෙළඳ ශේෂය**

2014 නොවැම්බර් මාසයේ දී වෙළඳ හිඟය 2014 නොවැම්බර් මාසයේ තිබූ එ.ජ.ඩොලර් මිලියන 726 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 630 ක් දක්වා සියයට 13.2 කින් සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වුවද, 2015 වසරේ පළමු මාස එකොළහ තුළ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 7,566 ක් දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් වැඩි විය.

**සංචාරක ඉපැයීම්**

2015 දෙසැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 206,114 දක්වා සියයට 15.4 කින් වර්ධනය විය. ඒ අනුව, 2015 වසරේ මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව 1,798,380 දක්වා සියයට 17.8 කින් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ මාලදිවයින 2015 වසරේ සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ වූ අතර වසර තුළ දී වූ සමස්ත සංචාරක පැමිණීම්වලින් සියයට 50.0 කට එම රටවල් දායක වී ඇත. 2015 වසරේ දී සමුච්චිත සංචාරක ඉපැයීම් 2014 වසරේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 2,431.1 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,862.9 දක්වා වර්ධනය විය[1].

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2015 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2015 නොවැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2014 නොවැම්බර් මාසයේ වූ එ.ජ.ඩොලර් මිලියන 619.3 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 574.5 දක්වා සියයට 7.2 කින් අඩු විය. 2015 වසරේ පළමු මාස එකොළහ තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ සමුච්චිත ප්‍රේෂණ 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 6,361.8 දක්වා සියයට 0.8 කින් සුළු වශයෙන් වර්ධනය විය. ලෝක තෙල් මිල අඩුවීමත් සමඟ තෙල් අපනයනය කරනු ලබන මැද පෙරදිග රටවල ආදායම පහළ යෑම ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සාපේක්ෂ අඩු වර්ධනය සඳහා හේතුවක් විය හැක.

**මූල්‍ය ලැබීම්**

2015 දෙසැම්බර් මස 16 වැනි දින ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව මගින් පොලී අනුපාතික ඉහළ දැමීම නිවේදනය කළ අතර එම පොලී අනුපාතික ඉහළ දමනු ඇතැයි වූ අපේක්ෂාව හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් කෙරෙහි බලපෑම් ඇති විය. ඒ අනුව, 2015 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන, 2014 වසර තුළ දී වූ එ.ජ.ඩොලර් මිලියන 113.1 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,093.4 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, ද්විතියීක වෙළඳපොළෙන් වූ එ.ජ.ඩොලර් මිලියන 32.3 ක ශුද්ධ ගෙවීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 36.3 ක ලැබීම් හේතුවෙන් 2015 වසරේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 4.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. 2015 වසරේ පළමු මාස එකොළහ තුළ දී රජය වෙත වූ දිගුකාලීන ශුද්ධ ණය ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 179.0 ක් විය. මේ අතර, 2015 ඔක්තෝබර් මස 28 වන දින ශ්‍රී ලංකාව විසින් එ.ජ.ඩොලර් මිලියන 1,500 ක නව වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කළ අතර එහි ලැබීම් 2015 නොවැම්බර් මස පළමු සතියේ දී වාර්තා විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2015 නොවැම්බර් මස අග දක්වා වූ වසර තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2014 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් බිලියන 1,628.3 ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,274.2 ක හිඟයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2015 නොවැම්බර් මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ආනයනික මාස 4.6 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් වූ අතර මුළු විදේශීය වත්කම් ආනයනික මාස 5.7 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 9.1 ක් විය. 2015 දෙසැම්බර් මස අග වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

2015 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 9.03 කින් අවප්‍රමාණය විය. 2016 වසර තුළ දී ජනවාරි මස 27 දින දක්වා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 0.1 කින් අධිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම මත පදනම්ව මෙම කාලපරිච්ඡේදය තුළ දී රුපියල යුරෝවලට එරෙහිව සියයට 0.7 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 3.8 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 3.5 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 2.2 කින් අධිප්‍රමාණය වූ අතර ජපන් යෙන්වලට එරෙහිව සියයට 1.8 කින් අවප්‍රමාණය විය.

**සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2014 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2014 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | 2015 ජන-නොවැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 921.2 | 835.2 | -9.3 | 10,125.0 | 9,678.6 | -4.4 |
| ආනයන | 1,646.8 | 1,464.9 | -11.0 | 17,619.3 | 17,244.4 | -2.1 |
| වෙළඳ ශේෂය | -725.7 | -629.7 | -13.2 | -7,494.3 | -7,565.9 | 1.0 |
| සංචාරක ඉපැයීම් | 190.6(ආ) | 229.5 | 20.4 | 2,146.7 | 2,534.8 | 18.1 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 619.3 | 574.5 | -7.2 | 6,309.0 | 6,361.8 | 0.8 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 43.3 | -0.4 | -101.0 | 150.2 | 7.5 | -95.0 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 96.9 | 116.9 | 20.6 | 4,727.6 | 4,304.5 | -8.9 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 74.2 | 70.1 | -5.6 | 1,711.2 | 1,205.0 | -29.6 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500.0 | 2,150.0 | 43.3 |
| දිගුකාලීන ණය | 21.8 | 46.7 | 114.0 | 1,438.0 | 922.5 | -35.9 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විදේශ ආයෝජකයන් වෙත ආයෝජනය කිරීමෙන් ලද ලැබීම්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.